රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
அரசாங்க தகவல் திணைக்களம்
Department of Government Information

**2021.01.02**

**නිවේදන අංකය: 07/2021**
**නිකුත් කළ වේලාව:19:45**

**අධ්‍යක්ෂ (ප්‍රවෘත්ති)**
**ප්‍රවෘත්ති කර්තෘ**

**<u>ප්‍රවෘත්ති නිවේදනය</u>**

**සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කොවිඩ් 19 ආසාදිත රෝගීන්ගේ මරණ 03ක් තහවුරු කරන ලද අතර ඒ අනුව ශ්‍රී ලංකාවෙන් වාර්තා වන මුළු කොවිඩ් 19 ආසාදිත රෝගීන්ගේ මරණ සංඛ්‍යාව 211 කි.**

**01.** **කොළඹ 13 ප්‍රදේශයේ පදිංචි වයස අවුරුදු 93 ක කාන්තාවකි. 2020 දෙසැම්බර් 30 වන දින නිවසේදී මියගොස් ඇත. මරණයට හේතුව ලෙස දැක්වෙන්නේ කොවිඩ් 19 ආසාදනය නිසා ඇති වූ බහුවිධ සංකූලතායි.**

**02.** **අනන්‍යතාවය සනාථ කළ නොහැකි වයස අවුරුදු 70ත් 80ත් අතර මරදාන පොලිස් වසමේ දී හඳුනාගත් පිරිමි පුද්ගලයෙකි. 2020 දෙසැම්බර් 30 වන දින මියගොස් ඇත. මරණයට හේතුව ලෙස දැක්වෙන්නේ කොවිඩ් 19 ආසාදනයයි.**

**03.** **කොළඹ 12 ප්‍රදේශයේ පදිංචි වයස අවුරුදු 76 ක පිරිමි පුද්ගලයෙකි. කොළඹ පෞද්ගලික රෝහලක සිට කොවිඩ් 19 ආසාදිතයෙකු ලෙස හඳුනා ගැනීමෙන් පසු හෝමාගම මූලික රෝහලට මාරු කර යවා ඇති අතර එම රෝහලේ ප්‍රතිකාර ලබමින් සිටින අතරතුර 2021 ජනවාරි 02 වන දින මියගොස් ඇත. මරණයට හේතුව ලෙස දැක්වෙන්නේ කොවිඩ් නියුමෝනියාව සහ සංකූල වූ වකුගඩු ආසාදනයයි.**

නාලක කලුවැව
රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්

163, කිරුළපන මාවත, කොළඹ 05, ශ්‍රී ලංකාව.
163, கிருலப்பனை அவனியூ, கொழும்பு 05, இலங்கை.
(+94 11) 2515759
(+94 11) 2514753
www.news.lk